# ස.ණ.ස.
# පුවත් කොළඹින්

2019 - ජුනි - හයවන කලාපය

දායකත්වය රු 15/-













# සිතට කාවැද්දිය යුතු සමුපකාරයේ වටිනාකම්

## සමුපකාරය පිලිබද ජනාධිපති කොමිෂන් සභාව

**2019 මැයි 12 දින පැවති සංවාදශීලි හමුවේ දී ගරු සභාපති ඩැනිසන් වීරසූරිය මහතා සමුපකාර නායකයින්ට ඉදිරිපත් කරන ලදී.**

සමුපකාරය ක්‍රියාත්මක කිරීමේදී එහි අනගි බව දියුණු කිරීමට අවශ්‍ය වන්නේ ආත්මාධාරය, ස්වයං වගකීම, ප්‍රජාත්නත්‍රවාදය, සමානාත්මතාවය, සාධාරණත්වය, .සාමුහිකත්වය, අවංක බව, විවෘත භාවය, සමාජයිය වගකීම සහ අන්‍යයන් පිළිබඳ වගකීම යන සංයුතීන් තුලිනි. පසුගිය දශක කිහිපය තුලම සිදු වූ දේශපාලන දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ගේ අවාසනාවට සහ ආතතිය තත්වයන්ට වගකීම දැරිය යුතු වන්නේ සාමාන්‍යයෙන් සමාජයත්, අන්‍යයනුත් බව සිතීමේ පුරුද්ද සාමාන්‍ය ජනයා අතර ඇබ්බැහි වී ඇත. දේශපාලනඥයින් විසින් තමා බලයට පත්වීම සඳහා තමන්ගේ ඡන්දය දෙන්නේ නම් ඡන්ද දයාකයින්ගේ සියලු ගැටලු විසදා දෙන බවට ඔවුන් තුල හැගීම් ඇති කිරීමෙන් මෙම අදහසට දායක වී ඇත. රජය මගින් නොමිලයේ ආහාර, නොමිලයේ අධ්‍යාපනය සහ නොමිලයේ සෞඛ්‍ය සහ වෛද්‍ය පහසුකම් වශයෙන් සුභසාධක පහසුකම් සැපයීමෙන් මෙම තත්ත්වය තවත් ශක්තිමත් කර ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් තම ජීවන තත්වය නගා සිටුවීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා කටයුතු කිරීමට තමාට හැකියාවක් තිබුණත්, දේශපාලකයින් හෝ රජය මැදිහත්වී තම ප්‍රශ්න විසඳන තෙක් බලාසිටීමේ පුරුද්දට වැටී ඇත. අද සමාජය මේ නිසා ආත්මාධාරය යන අනගිබව නොසලකා හැරීම වැඩි වෙමින් පවතී.


මෙනිසා මානුෂ්‍ය සම්පත් නාස්ති වීමටත්, නිර්මාණශීලී බව නැති වීමට සහ පුද්ගලයින් තනිව හෝ සාමුහිකව අනිත් අය සමගිව එකතු වී හෝ ඉදිරියට ගෙන ගොස් සම්පූර්ණ කළ හැකි බොහෝ දේවල් රජය හෝ දේශපාලකයින් ඔවුන් වෙනුවෙන් ඉටු කරාවි යන බලාපොරොත්තු කරා ඔවුන්ව ගෙන යාමත් සිදු වේ. මෙයට සම්බන්ධව වැඩිවෙමින් පවතින නැඹුරුවීම නම් පුද්ගලයින් ඔවුන්ගේ කටයුතු පිළිබඳව වගකීමට තමාට කිසි සම්බන්ධයක් නොමැති වීමයි.

බොහෝ සමාජයීය සහ කළමනාකරණ තත්වයන්හි දී තමාගේම කාර්යයකදී පවා අනුන් වෙත වගකීම පැවරීම පොදු දෙයක් බවට පත්ව ඇත. තනි තනිව ගත් විට පුද්ගලයින් ඉමහත් වෙහෙසක් දරන්නේ තමන් ගේ කටයුතු වලදී විශේෂයෙන්ම තමන්ට වැරදුනු තැන්හි දී එම වගකීම අන්‍යයන් විසින් නොගන්නේ කුමන හේතුවක් සඳහා දැයි සෙවීමටයි.

04 පිටුවට...

## පොසොන් පැතුම

**පොසොන් සඳකිරණ පැතුරුණු ලක් දෙරණයි**
**අරිඅට මගින් නිවනට පෑ මග සරලයි**
**කෙලෙසුන් සිත් පුරා ඉසි කෝ මද වපුරයි**
**හෙළයට වඩිනු මැන මිහිඳුනි, දම් සරණයි**



පබැදුම - හේමසිරි බෙනරගම

## 28 සැමරූ ගලවිලවත්ත



ගලවිලවත්ත උතුරු සණස සමිතියේ 28 වන සංවත්සරය සැමරුම, පසුගියදා උත්කර්ශවත් අන්දමින්, සමුපකාර ප්‍රසාදිනී, කොළඹ දිස්ත්‍රික් සංගමයේ ගරු සභාපති ඩැනිසන් වීරසූරිය, මැතිදුන්ගේ ප්‍රධානත්වයෙන් පැවතිණ. හෝමාගම කලාප අධ්‍යක්‍ෂ කුමාර ප්‍රසන්න ගීකියනගේ මහතා ඇතුලුව කලාප නායකයින් සහභාගි වන ලදී.

07 පිටුවට...

## සී.ස. හෝකන්දර දකුණ ප්‍රගති ස.ණ.ස. සමිතිය
## 32 වන සංවත්සර මහ සභාව



හෝකන්දර දකුණ ප්‍රගති ස.ණ.ස. සමිතියේ පසුගියදා පැවති 32වන සංවත්සරය කොළඹ දිස්ත්‍රික් සණස සභාපති සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසුරිය මහතාගේ ප්‍රධානත්වයෙන් සණස පරිශ්‍රයේදී පවත්වන ලදී.

07 පිටුවට...

## කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමයේ වත්මන් ගරු අධ්‍යක්‍ෂක මණ්ඩලය



ඩැනිසන් වීරසූරිය
ගරු සභාපති



එම්.ඒ.එස්. පෙරේරා
ගරු උපසභාපති



එම්. ජයකොඩි
ගරු උපසභාපති



ජයන්ති නවරත්න
ගරු අධ්‍යක්ෂිකා



සුනිල් අබේසුන්දර
ගරු අධ්‍යක්‍ෂක



යසසිරි අමරසිංහ
ගරු අධ්‍යක්‍ෂක



සී. ගමගේ
ගරු අධ්‍යක්‍ෂක



ජී.ඩී. කරුණාරත්න
ගරු අධ්‍යක්‍ෂක



ලලිත් පෙරේරා
ගරු අධ්‍යක්‍ෂක



බී. සුනිල් ප්‍රියලාල්
ගරු අධ්‍යක්‍ෂක



ප්‍රසන්න කුමාර ගීකියනගේ
ගරු අධ්‍යක්‍ෂක



ඒ.ඩී. ආරියපාල
ගරු අධ්‍යක්‍ෂක



සුදත් පුෂ්පකුමාර
ගරු අධ්‍යක්‍ෂක



තුසිත් කුමාර වීරවර්ධන
සාමාන්‍යාධිකාරී/ලේකම්

ස.ණ.ස.
පුවත් කොළඹින්



# කාලීන අවශ්‍යතාවයක්

ලොව නිර්මාණය වී ඇත්තේ රටවල් සමුහයකිනි. එවන් වු රටවල රාජ්‍යයන් බිහිව තිබේ. රාජ්‍යය පවත්වා ගෙන යාම සඳහා ආණ්ඩුවක් අවශ්‍යය. එම ආණ්ඩු ක්‍රියාත්මක වීම සඳහා ව්‍යවස්ථා තිබිය යුතුය.

එසේ නම් ව්‍යවස්ථා යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න, අප දැන සිටිය යුතුය. රටේ ජීවත්වන පුරවැසියන්ගේ අයිතිවාසිකම් දැක්වෙන ලේඛණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනුවෙන් සරලව දැක්විය හැක. මෙය රටේ ඉහළම නීතිය වන්නේය. ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියා කරන ආයතන පිළිබඳව විස්තරාත්මකව එහි දක්වා ඇත. මූලික නීතියක් ක්‍රියාත්මක කිරීම සඳහා නීතිමය හා දේශපාලන අණපනත් රෙගුලාසි සම්මත කර ගත යුතුවේ. සම්මත කරගත් නීති අණ පනත් වෙනස් කිරීමට අහෝසි කිරීමට හෝ නව නීති ගෙන ඒමට පාර්ලිමේන්තුවක් තිබිය යුතුය. එහි මහජන ඡනදයෙන් පත්ව සිටින්නා වු මන්ත්‍රීවරුන්ගෙන් තුනෙන් දෙකක් ඡන්දයෙන් හා ජනමත විචාරීමකින් පමණක් එම රෙගුලාසි ඇතුලත් කිරීම අහෝසි කිරීම සිදුකළ හැක.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදිය යුත්තේ, රටක ජීවත්වන සියළු පුරවැසියන් වේ. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක තිබිය යුතු සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්‍ෂා කරන බව එහි පළවේ. උදාහරණයක් ලෙස, මිනිසාගේ සිතුම් - පැතුම් ප්‍රකාශන, රැස්වීම් හා සංගම් පවත්වා ගැනීම, නීතියේ නිසි ක්‍රියා පටිපාටිය, සිරභාරයට ගැනීම, සමාජ ආර්ථිකය, නීති හැදීමේ හා ක්‍රියාත්මක කිරීමේ ආකාරය, අධිකරන ක්‍රියා මාර්ග, කොමිෂන් සභාවල ක්‍රියාකාරීත්වය, විගණක ක්‍රියා දෝෂාභියෝග පිළිබඳ ඇතුලත් කරුණු රාශියක් ඇතුලත්ව ඇත.

රටේ බලය බෙදී යන ආකාරය, ප්‍රාදේශීය සභා පළාත් සභා, පළාත් පාලන ආයතන, මධ්‍යම ආණ්ඩුව රට කරවන නීති රීති මෙන්ම, භාෂා පිළිබඳ දැනුවත්කම, ජනවාර්ග සංස්කෘතිය, ආර්ථික සංවර්ධනය යන ඉලක්ක ව්‍යවස්ථාවේ ඇතුලත්වේ.

පොදුජන හිතකාමී ව්‍යවස්ථාවක අවශ්‍යතාවය, වර්තමානයේ රටේ සිදුවන හා සිද්ධ වු බරපතල කරුණු කාරනා පිළිබඳව සිතා බැලීමේදී කිසිවෙකුට බැහැර කළ නොහැක. ව්‍යවස්ථා ගත පරමාර්ථ හා ස්වාභාවය ගැන ජනතාව දැන සිටිය යුතුය. ඒ සඳහා සෑම කෙනෙක්ම ව්‍යවස්ථාව හැදෑරීම හෝ ව්‍යවස්ථාවක් නිවසේ තබා ගැනීම ගැන අදහස් නොකෙරේ.

ජාත්‍යන්තර ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාත්මක වු ජනතා සංහාරය නිසා ජනවර්ග වශයෙන්, ආගම් වශයෙන්, හෝ දේශපාලන වශයෙන් පටුලෙස සිතා කොටස් වශයෙන් බෙදී වෙන්වී කටයුතු නොකළ යුතු බව රටේ පුරවැසි සියළු දෙනා සිතා, එක අරමුණකට පැමිණ තීන්දු තීරණ ගතයුතුව ඇත. ව්‍යවස්ථාවක තනි පුද්ගල බලයක් තහවුරු නොවිය යුතුය. ජනාධිපති බලතල වැඩිකර, අගමැති බලය වැඩිකර, නොගෙන අර්ථවත් ලෙස බලය බෙදීයන සේ සිංහල දමිළ, මුස්ලිම්, බර්ගර් මිනිස් වර්ගයාට සාමකාමිව ජීවත්වීමට මග සළසා දිය යුතුව ඇත.

සුළුතර කොටස් ස්ත්‍රීන් ළමයින් ආබාධිත වූවන් හා වැඩිහිටි අයිතිවාසිකම් තහවුරු කර දෙමින් විශේෂ ප්‍රතිපාදන ව්‍යවස්ථාවේ ගැබ් විය යුතුය. ආරක්‍ෂාව සැලසීමේදී, මිනිස් නිවහන් අහිමි නොකිරීමටත්, රජයේ ඉඩම් බලවතුන්ගේ ව්‍යාපාර සඳහා යොදා නොගැනීමටත්, මුල්‍ය කළමනාකරණයෙන් සියළු දෙනාගේ යහපත සඳහා අරමුදල් ඒකරාශී කිරීමටත් බදු පැනවීම සාධාරණ වී ව්‍යවස්ථාවට වගන්ති ඇතුලත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතියක පරමාර්ථ හා දැක්ම තුළින් ස්ථාපිතව ඇති සමුපකාර අතුරු ව්‍යවස්ථාව ද කාලීන වශයෙන් අර්ථගන්වා වෙනස් කළ යුතු කාලය එළඹ ඇත. ඒ අනුව රීති ද සම්පාදනය වීමෙන් ස.ණ.ස. ශක්තිමත් කිරීම බලධාරීන්ගේ වගකීම වේ.

**ස.ණ.ස. පුවත් කොළඹින්**

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
සී. ගමගේ
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk

# සංවිධානයක පැවැත්ම කෙරෙහි කළමණාකරුගේ භූමිකාව



වර්ථමානයේ සංවිධානයක් තුල සිටින කළමනාකරුගේ සැබෑ කාර්යභාරය කුමක්ද? එකී කාර්යභාරය සැබෑ ලෙස ඉෂ්ඨ කිරීමට අවශ්‍ය අත්දැකීම් මෙන්ම ධාරිතාවයක් තිබේද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මේ සියළු දේ එක්කර ගනිමින් කළමනාකරුවෙකු සාර්ථක වන්නේ කෙසේද? යන්න පිලිබදව හොද වැටහීමක් එම කළමණාකරුට තිබිය යුතුය. එම නිසා මුලින්ම කළමණාකරු යන්නෙහි අර්ථය කුමක්ද යන්න විමසා බලමු.

කළමණාකරුවා යනු ''කලයුතු දෙය මනාලෙස කරන පුද්ගලයාය''. මෙහි තේරුම කුමක්ද? එනම් කළමණාකරුවා යනු සිය වෘත්තියට පමනක් සීමා නොවුනු සිය අධ්‍යාත්මයෙන්ම සිය රැකියාව සමග බැදී සිටින්න යන්නය. එසේ සිය වෘත්තීය වගකීමට එහා ගිය කළමණාකරන වගකීමක් ඉටු කිරීමට නම් ඔහු හෝ ඇය විසින් ප්‍රධාන භූමිකාවන් තුනක් ප්‍රගුණ කල යුතුය.

**1. අන්තර් පුද්ගල භූමිකාව 2. තොරතුරු භූමිකාව 3. තීරණ ගැනීම සම්බන්ධ භූමිකාව**

ඉහත භූමිකාවන් තුන පිළිබඳව විස්තරාත්මකව විමසා බලමු.

**01. අන්තර් පුද්ගල භූමිකාව**

අන්තර් පුද්ගල භූමිකාව කළමණාකරුගේ ප්‍රධාන වගකීමයි. එය ඉතා වගකීමෙන් සහ විනිවිද භාවයෙන් යුතුව සිදු කළ යුතුය. එනම් සංවිධානයේ ප්‍රතිපත්ති තීරණය කරන කණ්ඩායම සහ පරිපාලන කණ්ඩායම අතර මනා අන්තර් පුද්ගල සම්බන්ධතාවයක් ඇති වන පරිදි වගකීමෙන් කටයුතු කල යුතුය. මෙසේ කිරීමේදී පහත සදහන් උප භූමිකා පිළිබඳ වැටහීමක් සහ ඒවා දැරීමේ හැකියාවක් ඕනෑම කළමණාකරුවෙකු තුලම ප්‍රගුණ කලයුතුය.

1. නාමමාත්‍ර විධායක ලෙස කටයුතු කිරීම.

මින් අදහස් වන්නේ සංවිධානයේ විවිධ රැස්වීම් වලට හා උත්සව වලට ආයතනයේ ප්‍රධානියෙකු ලෙස සහභාගි වීමයි. මෙය කළමනාකරුවාගේ ආයතනික පැවැත්මට මෙන්ම සාමාජීය පැවැත්මටද ඉතා අත්‍යාවශ්‍ය භූමිකාවකි. ඒ කෙසේද යත් කළමණාකරුවාගේ සංවිධානයට සම්බන්ධ විවිධ පාර්ශව වල සිටින හා නොසිටින සැමගේම අදහස් දැනගත හැකිවීමයි. එමගින් සිය සංවිධානයට උදාවන අවස්ථා සහ සංවිධානය සතු ශක්තීන් මෙන්ම සිය සංවිධානයට ඇතිවන තර්ජන පිලිබදව මනා අවබෝධයක් ලැබේ.

2. නායකයෙකු ලෙස කටයුතු කිරීම

එසේම කළමණාකරු හොද නායකයෙකු විය යුතුය. එනම් ක්‍රමවත්, සාර්ථක හා නිවැරදි නායකයෙකු ලෙස ක්‍රියාකල යුතුය. ආයතනයේ අරමුණු හා පරමාර්ථ නිසිලෙස ඉටුකර ගැනීමට මග පෙන්වමින් තම අනුගාමිකයින්ද ඒ මගෙහි යොමු කරමින් කටයුතු කරන්නා වු අයෙකු විය යුතුය. ආදර්ශමත් නායකයා යනු අනුභස්වාදී මෙන්ම, සියළු ව්‍යාපාරික කාර්යයන් සාමාජික කාර්යයන් මැනවින් දන්නා අන් අයට උපදෙස් ලබාදෙමින් ඔවුන් නිවැරදි මාර්ගයට අවතීර්ණ කරවීමට සමත්, සවන් දීමේ හැකියාවෙන් යුතු පුද්ගලයෙකි.

3. සම්බන්ධීකරන නිළධාරියෙකු ලෙස කටයුතු කල යුතුය.

එනම් සිය සංවිධානය වෙනුවෙන් වැදගත් බාහිර පාර්ශව සමග ගණුදෙනු කරන්නෙකු ලෙස ක්‍රියාත්මක විය යුතුය.

**02. තොරතුරු භූමිකාව**

මෙහිදී කළමනාකරුගේ ප්‍රධාන උප භූමිකාවන් වන්නේ,

1 තොරතුරු රැස්කිරීම 2. තොරතුරු බෙදා හැරීම. 3. මාධ්‍ය ප්‍රකාශකයෙකු වීමයි.

තොරතුරු රැස්කිරීමේදී සෑම විටම වඩාත් කාර්යක්‍ෂම හා ඵලදායී තීරණ ගැනීම සදහා කාලීන තොරතුරු රැස්කල යුතුය. සංවිධානයේ දැනට තිබෙන තොරතුරු රැස්කිරීම අත්‍යාවශ්‍ය වෙයි. සංවිධානයේ සුභ සිද්ධිය සදහා අවශ්‍ය තොරතුරු සංවිධානයේ පැවැත්ම සදහා වන තොරතුරු සහ සංවිධානයේ කාර්ය මණ්ඩල තොරතුරු රැස් කරමින් අදාල සැලසුම් සකස් කල යුතුය.

එසේම එසේ ලබාගත් තොරතුරු මනාව සකස් කොට බෙදාහැරීමද නිසි ලෙස සිදුකල යුතුය. එනම් රැස් කරගත් තොරතුරු තීරණ ගැනීම සදහා අවශ්‍ය අධ්‍යක්‍ෂ මණ්ඩලයට නිවැරදිව බෙදාහැරිය යුතුය. එසේම ඉහත භූමිකාවන් දෙක වන තොරතුරු රැස්කිරීම සහ බෙදාහැරීම නිවැරදිව සිදු කරන විට සම්බන්ධීකරන භූමිකාව නිසිලෙස සිදුවේ. එමගින් සිය සංවිධානය කෙරෙහි හොද ප්‍රතිරූපයක් ඇති කිරීමේ පූර්ණ අයිතිය මෙන්ම වගකීම අදාල කළමණාකරුවා සතුවේ.

**03. තීරණ ගැනීමේ භූමිකාව**

ඉහත සදහන් කල ප්‍රධාන භූමිකාවන්ගේ අවසාන භූමිකාවයි. මෙහිදී හොද කළමණාකරුවෙකු සතුව පහත සදහන් උපභූමිකා හතර ඉතා පැහැදිලිව ප්‍රගුණ කල යුතුය.

1 ව්‍යවසායකයෙකුගේ භූමිකාව 2. ආරවුල් සමනය කරන්නෙකුගේ භූමිකාව

3 සම්පත් බෙදාහරින්නෙකුගේ භූමිකාව 4 සාකච්ඡා කරන්නෙකුගේ භූමිකාව

**ව්‍යවසායකයෙකුගේ භූමිකාව යනු කුමක්ද?**

එනම් සංවිධානයේ පවතින විවිධ ව්‍යාපාරික අවස්ථ හදුනාගැනීම, සංවිධානය වෙනස් කිරීම් සහ වැඩි දියුණු කිරීමේ කාර්‍යභාරය එනම් ආයතනයක් තුල පවතින සීමිත සම්පත් කාර්යක්‍ෂමව හා මනාව උපයෝජනය කරමින් ඒවායින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමෙහි ලා කළමණාකරු නිර්මාණශීලි හා තීක්ෂණ බුද්ධියෙන් හෙබි අයෙකු විය යුතුය. එසේම ආරවුල් සමනය කරන්නෙකු ලෙස කලමනාකරුට මනා ඉවසීමක් මනා හදවතක් හා නිවැරදි දැක්මක් තිබිය යුතුය. එනම් කළමණාකරුට තම සේවාදායකයින්ගේ ගැටළු සහ ආරවුල් අපක්ෂපාතීව විසදීමට හැකියාව තිබිය යුතුය.

07 පිටුවට...



# බාලාපරාධ සහ බාලාපචාර පිටුදැකීම

දරු සෙනෙහස ස්වාභාව ධර්මය විසින් සෑම සත්වයෙකුටම උරුමකරදී ඇති උතුම් ගුණාංගයකි. දරුවාගේ අයිතිය මාපිය දෙපළට පමණක් සීමා නොවේ. ළමා අයිතිය හා ආරක්ෂාව යනු මුළු මහත් සමාජය සහ රජය විසින් දැරිය යුතුවේ. දරුවා යනු අගය කියා නිමකළ නොහැකි අනාගත සම්පතකි. සුදෙවුන් මහරජු බුදුරජානන් වහන්සේගෙන් දෙමාපිය භාරකරු අවසරයකින් තොරව දරුවෙකු මහණ නොකළ යුතු බවට ආයාචනය, දරුපෙමට ගැඹුරින් විග්‍රහ කිරීමකි. ''ස්වාමීනි පුත්‍ර ප්‍රේමය, දරු සෙනෙහස, යනු පුදුමය ජනකය කරන කාරණයකි. සම, නහර, මස, සිඳගෙන ඇටද, ඇට මිදුළුද සිඳ ගෙන ගොස් සදා කල් සිතට දුක් දෙවන්නකි.'' පටාචාරාව සියළු සැප සම්පත්ද, සිය සැමියාද පමණක් නොව හැදිවත පවා අහිමිව මේඝ ගර්ජනා මහා වර්ෂා මැද වනයේ අතරමංව සිය දරුවා බේරා ගැනීමට දැරූ වෙහෙස හද කම්පා කරවන්නකි. අද වන විට මෙම ගුණදර්ම පිරිහීමට ලක්ව ඇති ආකාරය කනගාටු දායකය. නීති විරෝධී ගබ්සා කිරීම්, උපන් ගමන් දරුවන් කැළෑවට විසි කිරීම්, මරා වල දැමීම්, අසන්නට ලැබේ. දෙමව්පියන් විසින් සිය දරුවාන්ට වධ හිංසා පැමිණවීම, ඥාතීන් සහ ගුරුවරුන් විසින් කායික සහ මානසික පීඩා පැමිණවීම, වැඩිහිටියන්ගේ ලිංගික අඩත්තේට්ටම් වලට ලක්වීම, සහ ශ්‍රම සූරා කෑම, අසන්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ පීඩාවට පත් දරුවන් අතර මුල්තැන ලැබෙන්නේ වීදි දරුවන්ටය. නගරාශ්‍රිත ලෑලි ගෙවල්, මුඩුක්කු, වලින් බිහිවන බොහෝ දරුවන්ට දෙමව්පිය රැකවරණය, දරු සෙනෙහස හරිහැටි නොලැබේ. ඔවුහු බොහෝ දෙනෙක් කුඩා කල සිට යාචකයන් ලෙස හැසිරෙති. වැඩිහිටියෝ මොවුන් සිය ආදායම් මාර්ග බවට පත්කර ගනිති. සමාජ විරෝධී ව්‍යාපාරවල වාහකයන් වශයෙන් භාවිත කරති. වතු ආශ්‍රිත කම්කරු පවුල්වල ඉන්දීය සම්භවයක් ඇති දරුවන් බොහෝ වරප්‍රසාද අහිමි පිරිසකි. නෛතික ආරක්ෂාවක් තිබුනද අධ්‍යාපනික, සෞඛ්‍ය, ආහාර ආදී පොදු පහසුකම් ඔවුනට සමානව නොලැබේ. ගැමි ගොවි ජනපද, හේන්, සහ දුෂ්කර ගම්මාන වල ජීවත්වන දරුවනට නාගරික ඉහළ පංතියේ වරප්‍රසාදවලට ලඟාවිය නොහැක. දිළිඳු භාවයේ අහිතකර බලපෑම ඊට හේතුවේ. ජීවන තත්වයේ කඩාවැටීම නිසා කෙනෙකු දෙදෙනෙකු හැර සෙසු අයට සිදුවන්නේ සාම්ප්‍රදායික ගම්වැසියන් බවට පත්වීම පමණකි.

වයස අවුරුදු 12 ට අඩු දරුවෙකු කරන වරදක් වරදක් හැටියට නීතිය ඉදිරියේ නොසලකනු ලබයි 1939 අංක 48 ළමුන් හා තරුණයින් පිළිබද ආඥාපනතට අනුව වයස අවුරුදු 14ට අඩු පුද්ගලයෙකු කරන වැරදි සම්බන්ධ නීතියේ ප්‍රතිපාදන ලිහිල් කර තිබේ. වයස අවුරුදු 18ට අඩු සියළු දෙනා ළමයින් වශයෙන් සලකනු ලැබේ. ළමයින් සදහා වන නෛතික පිළිසරණ ප්‍රමාණවත් නැති බැවින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල්ද ඇතුළුව අත්සන් තබන ලදී 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂ අධිකාරි පනත අනතුරුව සම්මත කර ගන්නා ලදී. ඒ අනුව ජාතික ළමා ආරක්ෂ ප්‍රතිපත්ති සකස් කර ගැනීම සදහා 2014 ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වැනි පරිච්ඡේදයේ 2 වැනි වගන්තියෙන් ළමා ආරක්ෂාව තහවුරු කර තිබේ. 1956 අංක 47 කාන්තාවන් තරුණයින් හා ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ පනතින් බාල වයස්කාර දරුවන් සේවයට යොදා ගැනීම තහනම් කර තිබේ. දණ්ඩ නීති සංග්‍රහය (1883) 308 වැනි වගන්තියට 1995 දී සිදුකල සංශෝධනයට අනුව ළමයින් කෲරත්වයට පත්කිරීම, නොහොබිනා සැලකිල්ලට පත්කිරීම, නොකළ යුතුය, දඩුවමකට යටත් නොකළ යුතුය. 1999 අංක 37 නඩත්තු පනත යටතේ ඕනෑම කලත්‍රයෙකුට මෙන්ම ළමයෙකුටද එකිනෙකාට නඩත්තු ඉල්ලීමේ අයිතිය ලබාදී තිබේ.

වයස අවු 16 ට අඩු කාන්තාවක් කැමැත්ත ඇතිව හෝ නැතිව ලිංගික ඇසුරකට යොදාගතහොත් අවුරුදු 20 දක්වා වූ සිර දඩුවම් ලැබිය යුතු බව නීතියේ සඳහන්වේ. යම් පුද්ගලයෙකු නිරුවත ප්‍රදර්ශනය කිරීම හෝ ලිංගික ඇසුරකට කරන සංඥාවක් පමණක් වුවද ලිංගික වරදක් සිදු කලාමෙන් සලකා දඩුවම් කළ යුතු බවට 1941 පාදඩ හෙවත් අයාලේයාම ආඥාපනතේ 07 වැනි වගන්තියෙහි සදහන්ය. මෙය විශේෂයෙන් පැසැල් වියේ ළමුන්ට මුහුණ දීමට සිදුවන කරදරකාරී සිද්ධියක් ලෙස හැදින්විය හැක. පාසැල් දරුවෙකුට ශාරීරික පීඩාවක් ඇතිවන අයුරින් පහරදුන් ගුරුවරියකට බරපතල වැඩ ඇතිව වසර දෙකක සිට දඩුවම් නියමවිය. දණ්ඩ නීති සංග්‍රහයේ 75 වගන්තියට අනුව අවුරුදු 08 ට අඩු ළමයෙකු සදහා සාපරාධි චෝදනා එල්ල කළ නොහැක. අනෙකුත් ළමුන් විසින් කරන අපරාධගනයේ වැරදි බාලාපරාධ වශයෙන් හැඳින්වේ. ශ්‍රී ලංකාවේ විදෙස් ශ්‍රමිකයන්ගෙන් ලක්ෂ 15ක් කාන්තාවන්ය. මොවුන් අතර සිටින බාලවයස්කාර දරුවන්ගේ මව්වරුන් නිසා පීඩාවට පත්වන දරුවන්ගේ ඉරණම අනතුරු දායකය. පාරිසරික හේතු මෙන්ම දිළිඳු භාවයද දරුවා හිංසනයට පත්කිරීමට හෝ බාලාපරාධ කරුවෙකු කිරීමට හේතු වනු ඇත. 1939 අංක 30 පනතින් පිංපඩි ගෙවීම මාතෘ සුභසාධන ඇතිකිරීම මෙන්ම 1940 1953 අතර කාලය තුළ පාසැල් දිවා ආහාරය, සහල් සලාකය ලබාදීම දිළිදුකම තුරන් කිරීමේ උත්සාහයක් ලෙස සදහන් කළ යුතුය. 2015 වසර තුල ළමා අපචාර සම්බන්ධ පැමිණිලි 10732ක් ලැබී තිබේ. 2017 වසරේදී පැමිණිලි 12093 ක්ද 2018 වසරේ ළමා ලිංගික අතරව පමණක් 1332ක්ද සිදුවූ බවට වාර්තාවෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක සදහන් කරයි. තවද බරපතල ළමා ලිංගික අපයෝජන සිද්ධි 670 ඊට ඇතුළත් බවද ප්‍රකාශ කරයි. කොළඹ දිස්ත්‍රික්කය මුල් තැන ගන්නා අතර, ගම්පහ, කුරුණෑගල, ගාල්ල, කලුතර, අනුරාධපුර දිස්ත්‍රික් වලින්ද මෙම තොරතුරු ලැබේ. පොලීසිය මෙම පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමට ''කාන්තා හා ළමා කාර්යංශයට'' පවරා ඇත. ළමාරක්ෂක අධිකාරියද ඊට සම්බන්ධව කටයුතු කරයි. දවසේ පැය 24 පුරා භාෂා තුනෙන් ක්‍රියාත්මක අංක 1929 දුරකථනය තොරතුරු ලබාගැනීමට යොදවා ඇත.

රටපුරා පවතින පෙර පාසැල් සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන රජය විසින් නියාමනය කළ යුතුවේ අන්තර්ජාලය ඔස්සේ අසභ්‍ය වෙබ් අඩවි පවත්වාගෙන යමින් ඒවාට දරුවන් ගොදුරු වීම නවතා දැමිය යුතුය. රූපවාහිනී රියාලිටි වැඩ සටහන් මගින් දරුවන් නොමනා ලෙස ස්පර්ශ කිරීම, නුසුදුසු වචන භාවිතය, තුළ මානසිකව සහ කායිකව පීඩනයට හිංසාවට ලක්වන්නේය. ළමයින් සම්බන්ධ නඩු විවෘත අධිකරණයේ අසන්නේ නැත. බොහෝ දුරට මහේස්ත්‍රාත්තුමාගේ කාමරය තුල නඩු අසන අතර, පරිවාස නිලධාරියාගේ වාර්තාව මත නඩුව විසදන අතර අනාගතයේ සමාජ ගතවීමට බාධාවන අයුරින් දරුවන්ට ගැටළු ඇති නොවන ලෙස අධිකරණය කටයුතු සිදුකරනු ලැබේ. අපයෝජනයට පත්වූ දරුවන් සදහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු ආයතන ගත කිරීම, සෞඛ්‍ය ආහාරපාන අධ්‍යාපනය පිළිබද පසු විපරම, ළමාරක්ෂ අධිකාරියට පැවරේ. මේ සදහා 'සුරැකුම් පව්ව' නමින් කමිටු පිහිටුවා ඇත. ළමාරක්ෂ අධිකාරි පනතේ 14 වැනි වගන්තිය අනුව නියාමනය පිළිබඳ වගන්ති දක්වා ඇත.

2014 වර්ෂයේදී ලෝකයේ මාර්ග අනතුරු වලින් ළමා මරණ 2,62,000ක් සිදුව ඇති බවට වාර්තාවේ මින් 90%ක් අඩු ආදායම් ලාභී රටවලින් විදුහල්පති සහ ගුරුවරයෙකු පහර දීමෙන් ළමයෙකුගේ කන පුපුරායාම ගැන මානව හිමිකම් කොමිෂමට පැමිනිල්ලක් ලැබී ඇත. ගුරුවරියකගේ පහරදීමෙන් ළමයෙකුට සිදුවූ ශාරීරික පිඩාවට අවු 02ක බරපතල වැඩ ඇතිව සිට දඩුවම් නියම වී තිබේ. පාසැල් දරුවන්ගේ විනය බලධරයා ගුරුවරයාය. දඩුවම් ලබාදී හිංසාවට පත් කිරීමට සදාචාරාත්මක අයිතියක් ඔහුට නැත. ශිෂ්‍ය නායකයන් යොදවා දඩුවම් කිරීම, සහ ළමයින් පාලනය කිරීම නොගැලපෙන ක්‍රියාවකි. මනෝවිද්‍යා කාල් රොජස් පවසන්නේ නව යොවුන් වියේ දරුවන් විරුද්ධ ලිංගිකයන් කෙරේ ආකර්ෂණය වීම ගුරුවරයා ගැඹුරින් වටහා ගත යුතු බවයි. බර්ටනඩ් රසල් පවසන්නේ හුදෙක් විෂය කරුණු පමණක් උගන්වන්නා ගුරුවරයෙකු නොවන බවයි. පරිවාසගත ළමුන් පරිවාස භාරයෙන් පැනගිය අවස්ථා වාර්තාවේ. අභ්‍යන්තර වශයෙන් සිදුවන හිංසා පීඩා මෙන්ම ලිංගික බලපෑම්ද ඊට හේතු වී ඇත. මේ නිසා කාන්තා පොලිස් නිලධාරිණියන් මේවායේ ආරක්ෂාව සදහා පත් කළ යුතුය. මල් කැකුලක්වන් දරුවෙකුට යහපත් අනාගතයක් උදාකර යහපත් පුරවැසියෙකු බවට පත්කිරීම අප සෑමගේ ප්‍රාර්ථනය විය යුතුය.

**යූ.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2 භාණ්ඩාගාරික සහ පර්ෂද ලේකම්**

# පහත්ගම හංවැල්ල 28 සමරයි

පහත්ගම හංවැල්ල සණස සමිතියේ 28 වන සංවත්සරය පසුගියදා ඉහළ හංවැල්ල ශ්‍රී විසුද්ධාරාම ධර්ම ශාලාවේදී විහාරාධිපති සණස සමිතියේ ගරු අනුශාසක මරදම්මඩුවේ විජයසිරි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

මෙම අවස්ථාව සදහා හංවැල්ල කලාප ගරු අධ්‍යක්ෂ ජී.ඩී. කරුණාරත්න මහතා හංවැල්ල පර්ෂද ලේකම් දිස්නා නයෝමි මහත්මිය ඉහළ හංවැල්ල සණස සමිතියේ ටී.ඒ. කරුණාදාස මහතා ඉහළ හංවැල්ල සණස සමිතියේ ගරු සභාපති ඩබ්.එල්.ඩී. කරුණාරත්න මහතාද සහභාගි විය.



**නව නිළධාරි මඬුල්ල**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | කේ.ඒ. පියතිලක |
| **ගරු උපසභාපති** | : | එල්. වයලට් පෙරේරා |
| **ගරු භාණ්ඩාගාරික** | : | ඇම්.ඩබ්. සෝමසේන |
| **ගරු කාරකසභික** | : | කේ.බී.ආර්. පෙරේරා, ලසන්ත අමිල කුමාර, ටී.පී.ඒ. රාණි, ටෙක්ලා නිරෝශිණී |

**කේ.ඒ. පියතිලක - ගරු සභාපති පහත්ගම සණස**

01 පිටුවෙන්...

# සිතට කාවැද්දිය යුතු සමුපකාරයේ වටිනාකම්

තම කාර්යන්හිදී විශේෂයෙන් වැරදුන තැන් වලදී තමා විසින්ම වගකීම ගැනීම පිළිබඳව ඇති ආචාරශීලී වටිනාකම සෝදාපාලුවට ලක්වීම ඉතා නරක ප්‍රතිඵල ලබා දෙයි. මිනිසුන්ට බලය හා වගකීම හිමිව තිබුණත් ඒ පිළිබඳව වැඩි සැලකිල්ලක් නොදක්වා ඉන් වැලකීමෙන් හැසිරීමට වඩාත් නැඹුරු වී ඇත. මක්නිසා ද යත් ඔවුන්ගේ වගකීමක් නොමැතිව කටයුතු කිරීම නිසා සිදුවූ වැරදි වලට තමාටම දඬුවම් විදීමට සිදුවීම බාර ගැනීමට මානසික බැඳීමක් නොමැති වීමයි.

විවිධ කළමනාකරණ තත්වයන් දරණ තනි පුද්ගලයින් බලය සහ වගකීම පවරන්නේ නැතිව කිසිදු සමිතියකට හෝ ආයතනයකට පාලනය කල නොහැකිය. ස්වයං වගකීම නොමැතිව වටිනාකම් නොසලකා හැරීමට ඉඩ හැරීම නිසා වගකීම දරණ තත්වයේ සිටින පුද්ගලයින්ට බලාපොරොත්තු වන ආකාරයට පොදු දේවල් සඳහා සේවා සැපයීමට ඔවුන් යොදවා ගැනීම විය නොහැකි දෙයක් බව එම නිසා පැහැදිලි වේ.

නූතන සමාජයේ වැඩි අවධානයක් යොමු විය යුතු අනිකුත් වටිනාකම් දෙකක් නම් ප්‍රජාතන්ත්‍රවාදය සහ සමානාත්මතාවයයි. මිනිසුන් තමන්ගේ සංස්කෘතික හා ගුණාත්මක සංයෝජනය නොසලකා අන්‍යෝන්‍ය ගරු කිරීම සහ සමානාත්මතාවය පිළිබඳව වැඩි වැඩියෙන් බලාපොරොත්තු වේ. සමාජයේ සිටින පුද්ගලයින්ට තනිව ඔවුන්ගේ විශේෂිත සංස්කෘතික හා ගුණාත්මක සංයෝජනය වලට විරුද්ධ නොවී, ඕනෑම ආයතනයකින් හෝ පරිපාලන ක්‍රමයකින් තමාට ගරු කිරීම් සහ සමානාත්මතාවය යන වටිනාකම් උසුලා ගැනීමෙන් පමණක් බව සිතීමට සහ ඒ අනුව ක්‍රියා කිරීමටත් ඔවුන්ට හැකිවේ. මෙම වටිනාකම් දියුණු කිරීම පිළිබඳ සැලකීමක් දැක්වීම අතපසු කිරීම නිසා ඉතා විනාශකාරී ප්‍රතිඵල ලැබීමට ශ්‍රී ලංකාව ද ඇතුලුව බොහෝ රටවල සමාජයන්ට සිදුවී ඇත. මෙම අනගිතාවයන් රට වැසියන්ට මෙන්ම රටේ නායකයින්ට ද බෙදා දීමට වඩාත්ම සුදුසු ආයතනය වන්නේ සමුපකාරයයි.

ආණ්ඩු ක්‍රමයන් සහ ඔවුන්ගේ දේශපාලන මතවාදීන් පිළිබඳව නොසලකා සමාජ වල පවුරක් සේ බැඳි ඇති සූරාකෑම් අධෛර්යමත් කිරීම සඳහා තවත් වැදගත් අනගි කරුණක් නම් සාධාරණත්වයයි. ධනවාදී සමාජ වල එහි ඇතැම් කොටස් ප්‍රාග්ධනය සහ බලය ඇති අයගේ සූරා කෑම් වලට ලක්වේ. සමාජවාදී සමාජ වල දේශපාලන සහ පරිපාලන අධිකාරයක් ඇති අය විසින් බලය නොමැති පුද්ගලයින්ව සූරාකෑමට ලක් කරයි. විවිධ ආකාරයෙන් වුවත් මේ සියල්ල සූරාකෑම්ය. සමුපකාර ක්‍රමයේ සංවිධාන මගින් සාධාරණත්වය වැනි වටිනාකම් උසස් කිරීමෙන් සියලු ආකාරයේ සූරාකෑම් අධෛර්යමත් කළ හැක. සමුපකාරයේ සාමාජිකත්වය ලබන සියලු දෙනාම ඉන් ප්‍රයෝජන ලබා ගැනීමට නම් ප්‍රාග්ධනයෙන් හෝ ශ්‍රමයෙන් දායක විය යුතු බවට බලාපොරොත්තු වේ. සමුපකාරයට සාමාජික ආර්ථික සහභාගීත්වය පිළිබඳව නිරීක්ෂණය කිරීමට නියම කිරීමෙන් මෙම සාධාරණත්වය නැමැති අනගිභාවය උසස් කර ඇත.

අනගිභාවයන් පිළිබඳව සිත් කාවදින ලෙස උගන්වා පරිත්‍යාගශීලී භාවය ඇති කිරීම සමාජයේ සූරාකෑම් වැලැක්වීමට අවශ්‍ය වේ. මෙය ව්‍යවස්ථාවන් සහ පරිපාලන රෙගුලාසි මගින් පමණක් කළ නොහැකිය. පරිත්‍යාගශීලී නොවී ප්‍රයෝජන ලබා ගැනීම හොඳ දෙයක් නොවන බව පුද්ගලයන් තුල විශ්වාසයක් ඇති කල යුතු වේ. පොදු ක්‍රියාවන් සඳහා සැම දෙනාම දායක විය යුතු අතර, එම දායකත්වයේ ප්‍රමාණානුකූල භාවය පිළිබඳව ප්‍රයෝජන භුක්ති විඳීමට පෙර සහතිකවවීම අවශ්‍යයි. සාධාරණත්වය පිළිබඳ අනගිතාවය උසස් කිරීම මගින් සමුපකාරය උත්සාහ කරන්නේ මෙම වෙනස්වීම මගින් පුද්ගලයින්ට ප්‍රතිඵලයක් ලබාදීමටයි.

විශේෂයෙන් දුර්වල සහ බලය නැති පුද්ගයන්ට බලය සහ අධිකාරයක් ඇති පුද්ගලයන්ට මුහුණ දීමේ දී සහ ඔවුන් සමග ගනුදෙනු කිරීමට සිදු වන අවස්ථාවන්හි දී සාමූහිකත්වය පිළිබඳ අනගිතාවය වඩාත් විස්තර කිරීමට අවශ්‍ය නැත. ප්‍රාග්ධනයක් ඇති පුද්ගලයින්ට බලය සහ අධිකාරය නොයෙකුත් මාර්ග වලින් විශේෂයෙන් ධනවාදී දේශපාලන ක්‍රම ප්‍රයෝජනයට ගැනීම මගින් පවරා ගැනීමට හැකිවේ. දුර්වල අයට ශක්තිමත් වීමට ඇති එකම මාර්ගය නම් එකට එකතු වී කණ්ඩායමක් වශයෙන් බලවත් සමගියෙන් කටයුතු කිරීමයි. මෙහිදී දුර්වල අයට තනි තනිව වැඩ කිරීමට සහ බෙදී ගන්නා උත්සාහයට වඩා සාමූහිකත්වය සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් වල වටිනාකමක් ඇත. සමුපකාරය මූලික වශයෙන් එකමුතුව වැඩ කරන ආයතනයක් ලෙස තනි තනිව වැඩ කිරීමෙන් තම අභිලාෂයන් ඉටු කර ගත නොහැකි එකට එකතුවීමෙන් හැර ප්‍රගතියක් ලබාගත නොහැකි පුද්ගලයන්ට සාමූහිකත්වයේ අනගිභාවයෙන් ශක්තිමත් හැඟීමක් ඇති කරයි. බලයක් නොමැති මිනිසුන් සාමූහිකත්වයේ අනගි බව වැඩි දියුණු කර සහ පවත්වා ගෙන යමින්, ඔවුන් ලගා කරගත් දේවල් පිළිබඳව අනාදිමත් කාලයක සිට ලෝකය පුරාම සෑම තැනින්ම විශාල වශයෙන් නිදසුන් දැක්විය හැකිය.

ලෝක දරුණු ජාත්‍යන්තර තරගයෙන් බේරී සංවර්ධනය වන ශ්‍රී ලංකාව වැනි කුඩා රටක් එහි පුරවැසියන්ගේ විවිධ කණ්ඩායම් අතර, සාමූහිකත්වය ගොඩ නගා ගෙන සිටියි.

සාමූහිකත්වය සහ එකමුතුව වැඩ කිරීම පවත්වා ගෙන යාමේ හැකියාව පදනම් වී ඇත්තේ කණ්ඩායමක් වශයෙන් එකට එකතු වූ තනි පුද්ගයින්ගේ ක්‍රියාකාරමකි. සහ හේතූන්ගෙන් අවංක භාවය මතයි. ඉහලින් තබා ඇති අවංක භාවය තුලින් කණ්ඩායම මත සාමාජිකයන්ට අන්‍යෝන්‍ය විශ්වාසය තහවුරු කොට කණ්ඩායම් ක්‍රියාකාරම් අඛණ්ඩව පවත්වා ගෙන යමින් දී ඇති පරමාර්ථ සියල්ල සම්පූර්ණ කිරීමට හැකියාව ලැබී ඇත. අවංකභාවය අඩුවීම නිසා නායකයින් කෙරෙහි ඇති විශ්වාසය නැතිවී යන අතර, කණ්ඩායම් සහ ආයතන කැඩී බිඳී යාම හෝ මිනිසුන්ට එකට වැඩ කිරීමේ දුෂ්කරතාවයට හෝ මුහුණ දීමට සිදුවීම අද රටේ බොහෝ ක්ෂේත්‍ර වල ක්‍රියාකාරකම් වලදී පැහැදිලිව දක්නට ලැබේ. එම නිසා සමුපකාරය ක්‍රියාත්මක කිරීමේ දී අවංක භාවයේ අනගිතාවය පිළිබඳ මධ්‍යස්ථව සිතීමට හැකියාවක් නොමැත. මෙම අනගිතාවය දියුණු කිරීම තිරණාත්මක වන්නේ සමුපකාරයේ සාර්ථකත්වයට පමණක් නොව ප්‍රජා සංවර්ධන කලාපීය සහ මුලු රටේම සංවර්ධනය සඳහා ඇති කල ඕනෑම සාමූහික ක්‍රියාවලියක සාර්ථකත්වය සඳහාත්ය. එබැවින් සමුපකාරය තුලින් අවංක භාවය නැමැති අනගිතාවය දියුණු කිරීම මුලු සමාජයටම පොදුවේ උපකාරී වේ.

සමුපකාරය මගින් දියුණු කරන විවෘත භාවය පිළිබඳ අනගිතාවය දේශපාලන සංවාදයේදී විනිවිද භාවය යනුවෙන් හදුන්වන දෙයට සමාන වේ. සමුපකාර අයිති වන්නේ එහි සාමාජිකයන්ට නිසාත්. එහි පාලනය ද ඔවුන් විසින් කරන නිසාත් තම සංවිධානයයේ සිදු වන්නේ කුමක් ද යන්න දැන ගැනීමට සමුපකාර සමිතියේ සැම සාමාජිකයෙකුටම අයිතියක් ඇත. සමුපකාර සමිතියක කුමන අන්දමේ ගනුදෙනු සිදු වුව ද, ඒ සම්බන්ධව සාමාජිකයින් නොදන්නා රහස් තිබිය නොහැක. ඔහුගේ සමුපකාරයේ කටයුතු පිළිබඳව තම දැනුම සැලකිල්ලට ගෙන අනිකුත් කිසිම සාමාජිකයෙකුට නොමැති අන්දමේ විශේෂ බලයක් පාවිච්චි කර අනික් සාමාජිකයන්ට වඩා ඉතා උසස් තත්වයේ සිටීම කිසිම සාමාජිකයෙකුට නොහැකිය. මේ හා සමානව කිසිදු සාමාජිකයෙකුට තමා දරණ තත්වය එසේ තිබියදිත් අනෙකුත් සාමාජිකයන්ගෙන් සමුපකාරය පිළිබඳ ඇති දැනුම වැලැක්වීමට අයිතියක් නොමැත. එම නිසා සමුපකාර සාමාජිකයන් අතර, සමානාත්මතාවය, ප්‍රජාතන්ත්‍රවාදය සහ අයිතිය පිළිබඳ හැඟීම පවත්වා ගෙන යාම සඳහා විවෘත භාවයේ ඇති අනගි තාවය තබාගත යුතුය. මෙම අනගිතාවය දියුණු කිරීම ආයතනය කෙරෙහි මෙන්ම එය පාලනය කරන නායකයින් කෙරහි ද විශ්වාසය ගොඩ නැගිමට උපකාරී වේ. ඕනෑම කණ්ඩායම් කාර්යයක් විනාශ කිරීම සඳහා දුෂ්ඨ අදහසින් පතුරුවන වැරදි තොරතුරු නැවැත්වීමට සහ අවිශ්වාසයන් නැති කිරීමටත් විශ්වාසම මාර්ගය මෙයයි.

මනුෂ්‍ය ඉතිහාසයේ කෙදිනකවත් නොතිබූ ලෙස වඩාත්ම අද සමාජයිය වගකීම සහ අනෙක් අය පිළිබඳ සැලකීම පිළිබඳ අනගිතාවය පුද්ගලයන්ගේ සිතට කා වැද්දිය යුතුය. සමානාත්මතාවය, පුද්ගලික නිදහස, මානුෂික අයිතිවාසිකම් මත පදනම් වූ ශිල්ප කර්මාන්ත සංවර්ධනය මුදල් ආර්ථිකය ව්‍යාප්තවීම, ආර්ථික කටයුතු වල විශේෂඥතාවය සහ දේශපාලන සිතුවිලිවල පරිණාමය යන මේ සියලු කරුණු පැරණි සමාජ පිලිවල කඩා බිද දමන ලදි. පවුල් සහ කුල සම්බන්ධතා, ප්‍රජාව තුල ගොඩ නැගුනු නෑදෑකම්, වෙනත් පාරම්පරික බැඳීම් ලිහිල් භාවයට පත් විය. මේ සියල්ලෙහිම ප්‍රතිඵලය වූයේ පුද්ගලයින් මහත් කොටසක් තමන්ගේ වැඩ කටයුතු පිලිබද පමනක් සිතීම ට නැඹුරු වීමයි. සෑම දෙනාටම මෙය කල හැකි නම් එය නරක දෙයක් නොවේ. නමුත් සමාජයේ දුප්පත් කම, අසරන කම, මහලුවීම සහ වෙනත් වාතාවරණයන් යටතේ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ඔවුන්ට පමණක් කටයුතු කළ නොහැකි විය.

ඇතැම් දේවල් තමාට සම්පත් තිබුනත් පුද්ගලිකව තනිවම කළ නොහැකි බව සටහන් කර ගත යුතුය. මෙවැනි අවස්ථාවන්ට පත් වු මිනිසුන් ගේ ජීවිත සකස් කිරීම සදහාත්, උපකාර අවශ්‍ය වු අයට උදව් කිරීම සදහා මුලිකත්වය ගෙන ඒ සදහා පෙළඹෙන පුද්ගලයින් සිටිය යුතුය. තවත් සමහර අවස්ථාවක් නම්, පුද්ගලිකවම තමාට අපහසුතා ඇති වුවත්, නායකත්වයට තවත් කෙනකු ගේ සමාජීය වගකීම බාර ගැනීමට සිදුවේ. සමාජයේ මිනිසුන් පුද්ගලිකව හා සමූහිකව තමන් බේරීම සදහා ඔවුනොවුන්ගෙන් යැපෙයි. එම නිසා සෑම දෙනාගේම යුතුකම වන්නේ එවැනි අවස්ථාවක් පැන නැගුණු සෑම විටම තම වගකීම් ඉටු කිරීමයි. සමාජයේ අනිත් අය පිළිබද සැලකිලිමත් බව පෙන්නීමට මෙය සෑහෙන තරම් හැඟීම් බර සහ පෙළඹවීම් සහිතයි. සමුපකාරය පුද්ගලයින්ගෙ සිතට කා වැදීමට සොයන්නේ මේ අනගිතාවයන්ය.

## පිටිපන නගරය සණස අවුරුදු සමරයි



මෙවර පිටිපන නගරය අළුත් අවුරුදු උත්සවය පසුගිය 20 වන දින දවස පුරා ස.ණ.ස. සමිති ශාලාව අසලදී පවත්වන ලදී. එහිදී ගරු සභාපති ජී.ඩී. කුලතුංග මැතිතුමා විසින් පොල්තෙල් පහන දල්වන ලද අවස්ථාව

**ලක්ෂ්මන් ගුණවර්ධන පිටිපන නගර වාර්තාකරු**

## කාන්තා කමිටු අළුත් අවුරුදු පොළ

නැගෙනහිර ඇරැව්වල අංක 02 සණස සමිතියේ කාන්තා කමිටුව සහ වාසනා ගොවි සමිතිය ඒකාබද්ධව 2019 සිංහල අළුත් අවුරුදු උත්සවය අරභයා පසුගියදා අලෙවිසල් දෙකක් පවත්වන ලදී. ඇරැව්වල විජය සිරි වර්ධනාරාම ක්‍රීඩා භුමියේදී පැවති මෙම පාරිභෝගික සේවාවේ සම්බන්ධීකරණ කටයුතු උප සභාපති ධම්මිකා මානෙල් පතිරණ මහත්මිය සිදු කරන ලදී. පොළ සදහා රස කැවිළි, රෙදිපිළි, නිමි ඇදුම්, වියළි ආහාර, අළුත් අවුරුදු කැවිළි, කැවුම්, කොකිස්, ආස්මී, කෙසෙල් විශේෂයෙන් අලෙවි කරන ලද අතර සහල්, පොල්, ආදී ආහාර ද්‍රව්‍ය මෙන්ම විසිතුරු මල් පැළැටිද අලෙවි කරන ලදී. මේ සදහා විහාරාධිකාරී සේනපුර නන්දරතන ස්වාමීන් වහන්සේගේ කාරුණික අනුග්‍රහය ලැබුණි.

**යු.ඩී.එස්. වීරසිංහ - වාර්තාකරු**

ස.ණ.ස.
පුවත් කොළඹින්



# සමුපකාර සමාජයක් බිහිකිරීමට නම්, සමුපකාර සාමාජිකයාගේ කාර්ය්‍ය භාරය කුමක්ද?

පෙර කලාපය හා සබැඳේ.....

අපි සමුපකාර සමාජයක් ගැන කථා කරන්නේ එය වූ කලී සමුපකාර දේපල ක්‍රමය පදනම් කරගත් සමාජ ක්‍රමයක් බව තේරුම් ගැනීමට විභජ්ජවාදී දයලෙක්තික දර්ශනවාදය හා විද්‍යාව ගැන අවබෝධයක් ලබා ගත යුතුව ඇත. එය එසේ ලබා ගැනීමෙන් සමුපකාරය පිළිබඳ අප තුල ඇති ව්‍යවහාර ඥාණය විද්‍යාත්මක ඥාණය බවටත් ඉන්පසු සාක්සරතා ඥාණය බවටත් ඊටත් පසු අනාවරණ ඥාණය බවටත් පත්වී මිනිසාගේ පළමුවන ක්‍රියාව වන ඥාණනය ක්‍රියාව අවසන් වනු ඇත.

ඉන්පසු එය පරිවර්ථන ක්‍රියාව බවටත් ඊට පසු ඇගයීමේ ක්‍රියවත් භාජනය වී සිවු වැන්න සන්නිවේදන ක්‍රියාවටත් පත්වී අවසාන ක්‍රියාව වූ සිත කය වචනය යහපත් ක්‍රියාවන්ගෙන් පෝෂණය කර ගෙන ඉතිහාසයේ සමුපකාරය සමුපකාරයේ අනාගතය බවට පත් කිරීමට ක්‍රියාත්මක වන පුරවැසියා බවට පත්වේ. එය නව සංස්කෘතියක් බිහි කරන සමුපකාර සංස්කෘති විප්ලවය ඇති කරන සාධකය වනු ඇත.

එය ණයට මුදල් හෝ භාණ්ඩ ලබා දීමෙන් හෝ භාණ්ඩ සහනාධාර වශයෙන් බෙදා හැරීමෙන් හෝ කළ හැකි ක්‍රියාවක් නොවේ.

කුමක් නිෂ්පාදනය කරන්නේද? කෙසේ නිෂ්පාදනය කරන්නේද? කා සඳහා නිෂ්පාදනය කරන්නේද? කොපමණ නිෂ්පාදනය කරන්නේද? එය බෙදාහැරීම, හුවමාරුව, පරිභෝජනය පමණක් නොව වෙළඳාමද කරන්නේ කෙසේද? යන්න අවබෝධ කර ගැනීමට සිදුවනු ඇත.

එහිදි නිෂ්පාදන මාදිලියේ ස්වභාවය හා ස්වරූපන් තේරුම් ගැනීමට හැකිවේ. එපමණක් නොවේ ඒ ඒ නිෂ්පාදන මාදිලියේ දේපල ක්‍රමය කුමක්ද? යන්න තේරුම් ගැනීමට අපට හැකිවේ. ඒ සදහා අප සමුපකාර දේශපාලන ආර්ථික විද්‍යා හා දර්ශනවාදය, සමුපකාර සමාජ විද්‍යාව හා දර්ශනවාදය, සමුපකාර කළමනාකරණ විද්‍යා හා දර්ශනවාදය, සමුපකාර ගණකාධිකරණය හා විගණනය පිළිබඳ විද්‍යා හා දර්ශනවාදය, සමුපකාර නීති විද්‍යා හා දර්ශනවාදය, සමුපකාර මානෝවිද්‍යා හා දර්ශනවාදය, සමුපකාර අධ්‍යාපනය විද්‍යා හා දර්ශනවාදය, ආදී විෂයන් ගැන අවබෝධය ලබා ගත යුතුය. ඒ වු කලී වෙන කිසිවක් නොව සමුපකාර ප්‍රතිපත්තියක් වශයෙන් ඇති සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව යන ජගත් ප්‍රතිපදාව කෙරෙහි අවධානය යොමු කර සමුපකාරය පිළිබද අනාවරණ ඥාණය පහල කර ගැනීමේ මාවතවේ.

එය ආරම්භ වන්නේ කෙසේද?

අප හිතමු සමුපකාර බැංකුවක් ආරම්භ කරනවායයි කියා. කුමන ව්‍යාපාරයක් ආරම්භ කරනවාද? එය ආරම්භ කරන්නේ කෙසේද? කා සදහාද? ආදි ප්‍රශ්ණ කෙරෙහි අවධානය යොමු කරමු. එය ආරම්භ කරන්නේ සාමාජිකයා සඳහාය. එය ආරම්භ කරන්නේ වෙළඳ පල අවශ්‍යතා සදහා නොව සමාජ අවශ්‍යතා සදහාය. එනම් සමුපකාර ජන සමාජයක් බිහි කිරීම සඳහාය. මේ ආකාරය ප්‍රශ්ණ කර සමුපකාර සාක්ෂරතා ඥාණයත් විද්‍යාත්මක ඥාණයත් අවධිකර ගත් පසු සමුපකාර අනාවරණ ඥාණය පහල වී සමුපකාර ව්‍යවහාර ඥාණය ඉවත්වේ.

මුල්‍ය බැංකුවක් නම් එහි මුදල් ඉතිරි කිරීම් ලබාගත යුතුය. ඉන්පසු ලබාගත් මුදල් ණයට දිය යුතුය. මේ හැර වෙන කිසිම කටයුත්තක් බැංකුවක් කරන්නේ නැත. මෙය තේරුම් ගත් ඕනෑම කෙනෙකු සමුපකාරය නිෂ්පාදන බලවේගයක් වශයෙන් ගොඩ නැගීමට අවශ්‍ය සමුපකාර නිෂ්පාදන සම්බන්ධතා ඇති කර ගැනීමෙන් සමුපකාර ජන සමාජයක් බිහි කිරීමට අවශ්‍ය මූලික පදනම දැමීම සිදු කරයි.

මෙම බැංකු ක්‍රමය ධනවාදි හා සමාජවාදි බැංකු ක්‍රමයෙන් වෙනස්ව සමුපකාර නිෂ්පාදන මාදිලිය ඇති කිරීමේ බැංකු ක්‍රමයක් බව තේරුම් ගැනීමේ සමුපකාර බැංකු න්‍යාමය කටයුතු කළයුතුව ඇත.

පාලිත ණය ක්‍රමයක් වශයෙන් භාවිතය ගන්නා ප්‍රජා මූලික බැංකු ක්‍රමය වන්නේ සමුපකාර බැංකු ක්‍රමයයි. සමුපකාර ෆෙඩරල් බැංකු ක්‍රමය ලංකාවේ බිහි වීමෙන් කියන කථාව එයයි. එය සමුපකාර සංවර්ධන බැංකු පනත මෙරට පාර්ලිමේන්තුවට ගෙන ආ පිලිප් ගුණවර්ධනයන්ගේ කථාව කියවන ඕනෑම කෙනෙකුට තේරුම් ගත හැකිය. මහජන බැංකුවේ කථාවෙන් කියන්නේ එයයි. අවාසනාවකට මෙය අද මහජන බැංකුවේ සේවය කරන කීදෙනෙකු මෙය කියවා තිබේද? යන්නය සොයා බැලිය යුතුව ඇත.

එයින් පැහැදිලි වන්නේ පවතින සමාජය වෙනස් නොකර අනාගත දැක්ම වන නව සමාජයක් බිහි කිරීමට ප්‍රවේශ වන ආකාරයයි. බෞද්ධ දර්ශනවාදයේ නිවන් දැකීමට පවතින සමාජය වෙනස් කිරීම අවශ්‍ය නොවන්නාක් මෙන් මෙයද එසේය. එහෙත් සමාජවාදය බිහි කිරීමට පවතින ධනවාදි සමාජය නැති කළයුතුමය. එතෙක් කල යුත්තේ ධනවාදීන්ට වන්දි බට්ට කම් කිරීමය. එය අපගේ රටේ ප්‍රොතෙස්ත්‍රන්ත්‍ර මාක්ස්වාදීන් ගෙන පැහැදිලි වී අවසානය. එය එසේ නම් අප කළයුත්තේ සමුපකාර ව්‍යවසායකත්වය වඩා සාමාජිකයා බලගන්වනම් කල හැකි දේ හා කළයුතු දේ කිරීමෙන් ඇතිවන්නාවූ ප්‍රමාණාත්මක වෙනස ගුනාත්මක වෙනස බවට පරිවර්තනය කර පැරණි දෙය නිෂේද වී අලුත් දේ බිහිවන කරවන නව ක්‍රියාවක් ලෙස සමුපකාරය ක්‍රියා තේරුම් ගැනීමය.

සමාජය පරිනාමය වන ක්‍රියා දාමයකි. අනිච්චතාවය එහි නෛසර්ගික ගුණයවේ. එහි හරයාත්මක ගුණය, දයලෙක්තිය ගුණය හා නෛතික ගුණය අප තේරුම් ගත යුතුව ඇත. මෙම තත්වයන් අප තේරුම් ගෙන ඉතිහාසයේ සමුපකාරය සමුපකාරයේ අනාගතය බවට පත් කර සමුපකාර ජන සමාජයක් බිහි කරමු.

අප ණය දෙන්නේ එය අපගේ පරමාර්ථයක් නිසා නොවේ. එය පරමාර්ථයක් ඉටුකර ගන්නා ක්‍රියා මාර්ගයක් වශයෙන්ය. එහෙත් යම් ක්‍රියා මාර්ගයක් පරමාර්ථයක් වුවහොත් එයින් කිසි දිනක පරමාර්ථ ඉටුවන්නේ නැත. එය හරියට නිදාගන්නේ සමාගම් රෙජිස්ට්‍රාර් ලගය. ගෙරවන්නේ සමුපකාර රෙජිස්ට්‍රාර් ළඟය. යන නියමය අනුව සමුපකාර භාවිතයන් ගොඩ නැගීමට කටයුතු කරනවාට දෙවන වන්නේ නැත.

සමුපකාරයෙන් අපි ණය දෙමු. පරිභෝගික භාණ්ඩ ලබා දෙමු. උත්සව පැවැත්වීමට ශාලා ඉදි කරමු. ඒවා එවැනි අයට ලබා දෙමු. මේ ආකාරය අපි නොයෙක් නොයෙක් වැඩ කරමු. ඒ සියල්ල අපගේ පරමාර්ථය නම් නොව පරමාර්ථය ඉටුකර ගන්නා වැඩ බව තේරුම් ගෙන අපි මේ සියල්ල කරමු.

(මෙය සමුපකාර මතවාදය අවධි කිරීමට කරන ආරාධිත අදහස්ය. ඔබ සමුපකාරිකයකු වශයෙන් සමුපකාර ජන සමාජය බිහි කරන සමුපකාර මතවාදය අවදි කර සමුපකාර න්‍යාය හා භාවිතය අතර ඇති පරස්පරය තේරුම් ගෙන ඊට දායක වෙමු.

**සුරේන්ද්‍ර ඩී. බුලත්සිංහල**
**සමුපකාර ජන සමාජයක් බිහි කිරීමේ ජාතික ව්‍යාපාරයේ අධ්‍යාපන, පුහුණු හා ජනමාධ්‍ය ලේකම්**

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 ජුලි 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **ජාතික ළමා ආරක්‍ෂක අධිකාරි පනත සම්මත වු වර්ෂය කුමක්ද?**

## කූපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 04**

**සී.ස. නැගෙනහිර මාලබේ සණස සමිතියේ**
**එල්.ආර්.ඒ.ඩී. චාන්දනී මිය**

## කූපන් අංකය 05

මුලකුරු සමග නම: ......................................................
ස්ථිර ලිපිනය: ......................................................
......................................................
දුරකථන අංකය: ......................................................
පුරුදු අත්සන: ......................................................
සණස සමිතියේ නම: ......................................................
......................................................
පිළිතුර: ......................................................
......................................................

## කාර්යාල කාර්ය සේවක තනතුර සදහා

**රාජගිරිය නැගෙනහිර ස.ණ.ස බැංකුවේ සේවය සදහා**
**කාර්යාල කාර්ය සේවකයෙකු**
**බඳවා ගැනීම සදහා අයදුම්පත් කැඳවනු ලැබේ.**


වයස අවු 50 ට අඩු විය යුතුය.

*අයදුම්පත් එවිය යුතු ලිපිනය*

**සභාපති, රාජගිරිය නැගෙනහිර ස.ණ.ස බැංකුව,**
**නො 06, මැදවැලිකඩ පාර, රාජගිරිය.**

# ‘පූජාව පූජනීයං...’

## මැල්කම් රංජිත් හිමිපාණෝ



‘ඇල්බට් මැල්කම් රංජිත් පටබැඳිගේ දොන්’ යනු නිල බලයෙන් ශ්‍රී ලංකාවේ අග්‍රධරයා ලෙසින් සේවය කරන කතෝලික සභාවේ කාදිනල් තුමෙක් වෙයි. 1947 නොවැම්බර් 15 දින උපත ලද එතුමා කොළඹ අගරදගුරු පදවිය හොබවයි.

1975 ජූනි 29 දින, සයවන පාවුළු පාප් වහන්සේ අතින් පූජකවරය ලද එතුමා, අභිෂේක ගන්වන ලද්දේ, 1991 ජූනි 17 වන දින නිකලස් මාකස් ප්‍රනාන්දු පියතුමා විසිනි. එතුමා කාදිනල් පදවියෙන් පිදුම් ලැබුවේ 2010 වසරේ නොවැම්බර් 20 වෙනි දිනයි.

කාදිනල් රංජිත් පියතුමන්, මින් පෙර කොළඹ සහායක රදගුරු ලෙසින් (1991-1995)ද, රත්නපුර රදගුරු ලෙසින් (1995-2001)ද, ජනතා ධර්මදානය පිළිබඳ සසුන් නියෝජනයේ සම ලේකම් ලෙසින් (2001-2004)ද, ඉන්දුනීසියාව සහ නැගෙනහිර තිමෝරය සඳහා අපෝස්තලික තානාපති ලෙසින් (2004-2005)ද, සහ ජන වන්දනාව හා සක්‍රමේන්තු විනය පිළිබඳ සසුන් නියෝජනයේ මහ ලේකම් ලෙසින් (2005-2009)ද, සේවය කර ඇති සේක.

මැල්කම් රංජිත් පියතුමන්, පොල්ගහවෙලදී, දොන් විලියම් සහ මේරි විනිෆීඩාට දාව උපන්නේ පවුලේ එකම පිරිමි දරුවා ලෙසිනි. 1956 දී බොරැල්ලෙහි ශාන්ත ඇලෝසියස් දේවධර්ම ශාස්ත්‍රාලයට ඇතුළු වීමට පෙර, එතුමා අධ්‍යාපනය ලැබුවේ, මෝදර ‘ඩී ලා සාල්’ විද්‍යාලයෙහිදීය. 1966 සිට 1970 දක්වා එතුමා මහනුවර ජාතික දේවධර්ම ශාස්ත්‍රාලයෙහි දේව ධර්මය සහ දර්ශනවාදය පිළිබඳව හැදෑරීය. ඉන්පසුව, එවකට අගරදගුරුතුමාණන්ව සිටි තෝමස් කාදිනල් කුරේ පියතුමන් විසින් මෙතුමාව වැඩිදුර පූජක අධ්‍යාපනය සඳහා රෝමය වෙත යවන ලදුව, එහිදී එතුමාණන් පොන්ටිෆිකල් උර්ධානු විශ්ව විද්‍යාලයෙන් දේවධර්මවේදී (බී.ටී.එච්.) උපාධියෙන් පුදනු ලැබීය.

අප රටේ පසුගියදා සිදුවුනු ත්‍රස්තවාදී ක්‍රියා දමයන්ට එරෙහිව ප්‍රබල හඬක් සහ විරෝධයක් පළ කල කාදිනල් තුමා ගැන අප රටේ සියළුම පිරිස් එකමුතුව කථාකිරීම අගේ කල යුතුයි. එතුමාට දක්වන ගරු කිරීමක් ලෙස, මෙවර නොබෙල් සාම ත්‍යාගය දෙන්නට සුදුසුම පුද්ගලයා ලෙස එතුමා නම් කරමි.

**ලක්ෂ්මන් ගුණවර්ධන - පිටිපන නගර සණස වාර්තාකරු**

## ජාතක කතා පොතෙන්
# උලූක ජාතකය

පෙර සිට පැවත එන නීතිය ගරු කරමින්
අධිපතිකමට ඇති තේජස, රුව දරමින්
අණ දෙන්නෙකු සොයා පෙරමුණ තැන ගනිමින්
මිනිසා අතර රජු පත්විය, සෙත සදමින්

අඳුරු කැලෑ රොද සිව්පාවුන් අතරේ
මිතුරු කමින් සුහදව රොක් වී නිතරේ
සොඳුරු සතුන් සිටියත් බහදී මතුරේ
රුදුරු සිංහයා රජවිය ලෙන් කුහරේ

විහඟුන් වෙසෙන අඩවිය ඇති හිමාලයේ
පෙනුමෙන් රූපයෙන් ගොරහැඩි සරීරයේ
බකුසුන් සුදුස්සා නායක ලෙස පැතුයේ
දැනුමෙන් කීය, කපුටා දෙවනුව තුටියේ

මෙතරම් පමෝද සිත් පිනවන වෙලාවේ
කොතරම් නපුරු පෙනුමක් වෙද සොබාවේ
මනරම් සිනා නොදකින නෙත් මුලාවේ
නොතරම් වේය, කිපුනොත් බස කලාවේ

කපුටා ඉගිල ගියෙ විරොදය පා බසුට
හැමටා කලින් එලවා ගියෙ එම බහට
රවටා බසක් නොදොඩා බකුසා සැමට
කුමටා කියන්නද දෙදෙනගෙ වෛරය නිවට

රංවන් හංසයා රජවී විහඟුන් සතුටින්
දෙනුවන් අයා පිළිගෙන රජකම සතුටින්
හැමගෙන් සුබ පැතුම් ලැබගෙන, හිත සතුටින්
පෙනුමෙන් සුදුස්සා පිළිගති හැම අවටින්

*උපදේශය:* *අධිපතිකම ලබන්නා, ප්‍රිය දැකුමෙන් පෙනී සිටිය යුතුය.*

*-සිරි-*

# අවුරුදු පොල

**එස්. රත්නසිරි - භාණ්ඩාගාරික, කලාප උපසභාපති**



නැගෙනහිර රාවතාවත්ත සණස සමිතිය මගින් 4වන වරට පවත්වන ලද අවුරුදු පොල පසුගියදා නැගෙනහිර රාවතාවත්ත කාර්යාල භූමියේදී පවත්වන ලදී. එයට නිලධාරි මණ්ඩලය ඇතුලු සෑම සාමාජික සාමාජිකාවගෙන්ම උපරිම සහයෝගය ලැබිනි. එම නිසා එය සාර්ථක කර ගැනීමට හැකිවිය. විශේෂයෙන්ම අප සමිතියේ සභාපති රංජිත් විද්‍යාරතන මහතාගේ මග පෙන්වීම අනුව මෙය සාර්ථක කර ගැනීමට හැකිවිය.

## සී.ස. දකුණු රත්මලාන සණස සමිතිය
# 21 වන සංවත්සර සැමරූ වගයි

දකුණු රත්මලාන සණස සමිතියේ 21 වන සංවත්සර මහා සභාව පසුගියදා දකුනු රත්මලාන සණස දේශන ශාලාවේදී පවත්වන ලදී. මෙදින ආරාධිත අමුත්තන් ලෙස කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) ලක්ෂ්මන් අමරතුංග මහතා, බොරුපන සණස සමිතියේ ගරු සභාපති දේවිකා ජයසිංහ මහත්මිය, උතුරු කටුබැද්ද සණස සමිතියේ ගරු සභාපති නිශ්ශංක විජේබණ්ඩාර මහතා හා එම සමිතියේ ලේකම් පී.ජී. ධර්මසිරි මහතා, බටහිර රාවතාවත්ත සණස සමිතියේ ගරු සභාපති රෝහණ මහතා ඇතුළුව දිස්ත්‍රික් සංගමයේ ගරු අධ්‍යක්ෂක හා දකුණු රත්මලාන සණස සමිතියේ ගරු සභාපති බී. සුනිල් ප්‍රියලාල් මහතා සහභාගී වුහ.

ප්‍රධාන ආරාධිත දේශණය පැවැත්වූ මූල්‍ය කළමණාකරු අමරතුංග මහතා රැස්ව සිටි සියලුම දෙනාට ඉතා අගනා හරවත් දේශනයක් පවත්වන ලදී. සියලුම ආරාධිත අමුත්තින්ගේ සුභාශිංසන මැද ඔවුන්ගේ සුරතින් සාමාජික සාමාජිකාවන්ට තිළිණ ප්‍රදානය කරන ලදී.

**2019 වසරේ නව නිළධාරි මන්ඩලය**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | බී. සුනිල් ප්‍රියලාල් |
| **ගරු උපසභාපති** | : | කුමුදුනී පෙරේරා |
| **කාරක සභික** | : | එම්.ආර්.එම්.එල්.එල්. ගුණවර්ධන, මල්ලිකා ලොකුගේ, හේමන්ත යාපා, කේ.ජී. සෝමාවතී, ඩබ්.එම්. නාලනී, කුසුමා චාන්දනී, මාලා ධම්මිකා |

**එම්.ආර්.එම්.එල්.එල්. ගුණවර්ධන වාර්තාකරු දකුණු රත්මලාන සණස**

## ගණඳුර මැද

හිමිදිරියේ ලා හිරු රැස්
සිපගත් දෙරණයි,
තණ ගොබ
සීනු හඬින් දෙව් මැදුරේ
විසිරී යන පරෙවි රෑන
වසා විදුලි කම්බිය මත
ඔරසන් කීමට සැරසේ,
දෙවිඳුන් ඇණ ගසා සුරැකි
කුරුසය හැරපියා සැනෙන්
උට්ඨානය වී දෙවොලම
අල්තාරයෙ ඉටි පහණින්
යාඥාව හා මුසු වී
බැතිමත් සිත් පහන් කලා.
රුදුරු යක්‍ෂයා එකවර
ගිණිජාලා විසුරුවමින්
බැතිමත් සිරුරුද කැබලිව
ලේ දහරා ගලා ගියේ
මිනිස් අදෝනා සමගින්
පිපිරුණ, තෙරපී, යදමින්
සිදී, බිදී, කැඩී. ගියේ
දෙව් ප්‍රතිමා නැත දුටුවේ
සුරුවම, කොන්තය ලේ කැටි
ඉතිරිව ඇති සැකිලි පෙනේ
අනියත බව සසරේ දුක
දෙසූ, අමා මෑණී වඳමි !

**පබඳුම**
**හේමසිරි බෙනරගම**

**පොඩ්ඩොත් එක්ක Media**

- සන්නිවේදන කුසලතා සංවර්ධනය
- නිර්මාණශීලි කථනය
- ළමා පෞරුෂය සංවර්ධය
- නිවැරදි සිංහල භාෂා භාවිතය
- කටහඬ පුහුණු කිරීම
- ගුවන්විදුලි, රූපවාහිනි වැඩසටහන් ඉදිරිපත් කිරීම

**රේඩියෝ එක (radioeka.lk)**
**අන්තර්ජාල ගුවන්විදුලි මැදිරිය තුල**
**ප්‍රායෝගික පුහුණුව**

**සණස පිළියන්දල (කැස්බෑව කලාප කාර්යාලය)**
**71/9, කොළඹ පාර, පිළියන්දල.**

සීමිත සිසුන් පිරිසක් බඳවා ගැනේ.

මෙහෙයවීම: **ඉන්දික දුෂාන්ත කෝරාළගේ**
0718726424, 0777127890

# සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


ඩී. වීරසූරිය


එච්.එල්. උක්වත්ත


ශිරානි විරසූරිය


ජී. සෝමවතී


මාග්‍රට් පීරිස්


එච්.ඒ.පී. ශානිකා


ප්‍රියංකා ප්‍රනාන්දු


ශ්‍රියාණි පෙරේරා


කාන්ති වර්ණකුල


සන්ධ්‍යා කල්යාණි


උදේනි ශෂිකලා


පවනි උපේක්ෂා


බියට්‍රිස් ෆොන්සේකා


ලහිරු නාමල්


ඩිල්ෂාන් මලිදු

01 පිටුවෙන්....

## සී.ස. හෝකන්දර දකුණ ප්‍රගති ස.ණ.ස. සමිතිය



සභාපති - හෝකන්දර ප්‍රගති සණස

## උපහාර පිදුම

ටෙම්ප්ලර් පාර සණසේ
වසර දාහතරක් පුරා
ගරු සේවයක් කලේ සණසට
භාණ්ඩාගාරික තුමිය විලසට
අවංකව නිහතමානීව
එයට උපහාරයයි මේ.

ඇවැසි සැම විටකම
අම්ල මෙහෙවර කලේ අපහට
එය අගය කරමින්
කරන උපහාරයයි මේ

වාර්තා ලිපි කවි ගී
හැකි සෑම විටම සැපයු
කරන ලද සේවයට
පිදෙන උපහාරයයි මේ

ඒ අම්ල මෙහෙවර නිමකොට
අද ගතින් දුබලව සිටින
ඔබතුමිය වෙනුවෙන්
පිදෙයි මේ උපහාර

නිදුකින් නිරෝගිව
ලබන්නට දීඝායු
පතමු අප සැම ඔබට
මෙත් සිතින් සොම්නසින්

**බී.ඒ. දයාකාන්ති**
**උපසභාපතිනි**
**ටෙම්ප්ලර් පාර සණස**

## බුදු හිමියනි වඩිනු මැනවි

බුදු හිමියනි වඩිනු මැනවි
ලක් දෙරණට වඩිනු මැනවි
ලක් දෙරණේ හැම දනහට
පන්සිල් අමතක වීලා

මුදල් පස්සෙ හඹා ගොසින්
පස්පව් හරියට කරනව
ඔබ වහන්සේ දෙසු දහම
කිසිවෙකු නෑ සලකන්නේ

අනේ අපේ බුදු හිමියනි
කරුණාවෙන් මේ අහන්න
මගේ ඇරයුම පිලිඅරගෙන
හනිහනිකට මෙහි වඩින්න

ලොවටම ගැලපෙන විලසින්
නැවත වරක් දම් දෙසන්න
සිහි බුද්ධිය ඇතිවීමට
අමා වැස්ස වස්සවන්න
පස්පව් සෝදා හරිමින්
හැම හදවත් සිසිල් වෙලා
දහම් බලෙන් රට සැනසෙයි

එයයි මගේ පරම පැතුම
නිවන් මගට යොමුවන තුරු

**ටෙස්ලි බැසිල්ඩා ගුණවර්ධන**
**සී.ස. එගෙඩඋයන**
**සණස සමිතිය**

01 පිටුවෙන්....

## 28 සැමරූ ගලවිලවත්ත

ගරු සභාපති සුගතපාල විජේකෝන් මහත්මා පිළිගැනීම කරන ලදී.

ආරාධිත දේශණය පැවැත්වූ වීරසූරිය මහත්මා,

දිලිදු අය හා සමීපව සම්බන්ධතාවල අගය වැඩිවන බවත්, ගනුදෙනු කිරීම නිවැරදිව තැබිය යුතුයි. ඒවා ගැන නායකත්වය විමර්ෂණය කල යුතුයි. මිනිසුන්ගේ ආකල්ප වෙනස්කල හැක්කේ අප නිසිසේ හැසිරීමෙනි. මුල්‍ය වාර්තාව පිළිබඳ විග්‍රහයක් කල එතුමා, සමුපකාරයේ බලය ඇත්තේ එකමුතුවීම මතය සමුපකාරය මිනිසුන්ගේ බලය ක්‍රියාත්මක කිරීම විනා ධනය ක්‍රියාත්මක කිරීමක් නොවේ. එතුමාට කරන ගෞරවයක් වශයෙන්, එතුමාගේ මා..... අනුගමනය කරනා ලෙසයි.

සුගතපාල විජේකොන් මහතා,

පවුලේ දෙවෙනියාවු එතුමා, ඔහුගේ ජීවිතයේ 54 වසරක් දහම් පාසැල් සේවය කල බවත්", ඇදුමට කැමැත්තෙන් යුධ හමුදාවට බැදුන බවත්, කොයි කාට කුමක් ලැබුනත්, තව කෙනෙකුගේ සතුට දැක අප සතුටු විය යුතු යැයි පැවසීය.

අධ්‍යක්‍ෂ කුමාර ප්‍රසන්න ගීගනගේ මහතා,



අද දවස සාමාජිකයන්ගේ දවස බවත්, ගමන ආපස්සට යාමට නොව, ඉදිරියට යාමට කටයුතු කලයුතු බව පොත්පත් ටික හරියට සකස් කර, අධ්‍යක්‍ෂමණ්ඩලය ක්‍රියා කරයි නම්, සණස සමිති නොවැටෙනා බව, යුතුකම් හා වගකීම් ඉටුකර නොහැකි නම්, නිලයකට පත්විය නොවිය යුතුබව පවසන ලදී.

මෙදින ගරු සුගතපාල විජේකොන් මහතා ඉටුකල සුවිශේෂි මෙහෙවර වෙනුවෙන්, ගෞරව උපහාරයක් සමග මුදල් ත්‍යාග ප්‍රදානයක් කරන ලදී. කාන්තා කමිටු සභාපතිනි ගරු ප්‍රේමලතා වණිගසේකර ම.මියටද, එසේම උපහාරයක් සහ මුදල් ත්‍යාගයක් පිරිනමන ලදී.

වසරේ හොඳ පැමිණීම, හොඳ ගණුදෙනු කිරීම සම්භාවනීය සාමාජිකයන් ඇගයීමක්ද කරන ලදී.

**නව නිළධාරී මණ්ඩලය**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | සුගතපාල විජේකොන් |
| **ගරු උප සභාපතිනිය** | : | සී.එම්. අබේසූරිය |
| **ගරු ලේකම්** | : | චිත්‍රා ජයලත් |
| **ගරු භාණ්ඩාගාරික** | : | සුභාෂිනී දීප්ති |
| **ගරු කාරකසභික** | : | මොරින් තිසේරා, ඉනෝකා කොටින්ගමුව, අරුණ වෙහෙරගොඩ |

**ප්‍රේමලතා වණිගසේකර**
**ගලවිලවත් උ. කාන්තා කමිටු සභාපතිනිප පිං2**

02 පිටුවෙන්....

## කළමණාකරුගේ භූමිකාව

එපමණක් නොව, සම්පත් බෙදාහරින්නෙකු ලෙස සිය සංවිධානය තුල මනා කලමනාකාරීත්වයක් පවත්වාගෙන යා යුතුය. නමුත් වර්ථමානයේ බොහෝ සංවිධාන වල සම්පත් බෙදාහැරීම වෙනුවට සම්පත් නාස්තිය සිදුවන බව ඉතා හොදින් පෙනී යයි. මෙය බලවත් කළමණාකරන දෝෂයකි.

එමනිසා කළමණාකරු වනාහි ඉහත ගුණාංවලින් යුතු සිය සංවිධානය නිවැරදි දැක්මක් ඔස්සේ ගෙන ගොස් අරමුණු ඉෂ්ඨ කර දිය හැකි පුද්ගලයෙකු බව ඉතා හොදින් වටහාගත යුතුය. දැන් ඔබට කළමණාකරුවාගේ භූමිකාව මනා ලෙස වැටහෙනවා යැයි සිතමි.

**තුසිත් කුමාර වීරවර්ධන - සාමාන්‍යාධිකාරි කොළඹ දිසා. සංගමය**

# 50 වෙනි සංවත්සරය අභිමානයෙන් සැමරූ නාවල - කොස්වත්ත සණස සමිතිය

1969 වසරේ ආරම්භ කරන ලද නාවල - කොස්වත්ත සණස සමිතිය වසර 50ක ඉතිහාසය තුළ සාමාජිකත්වයට පමණක් නොව ප්‍රදේශවාසී ජනතාවට ද ඉමහත් සේවාවක් සලසමින් මෙතෙක් පැමිණි ගමන් මග දුෂ්කරතාවයන් හමුවේ වුවද බාධක මැඩ ගනිමින් ලබා ඇති ප්‍රගතිය සනිටුහන් කරමින් 2019 මාර්තු මස 10 වෙනි දින නාවල කොස්වත්ත සෝලිස් උත්සව ශාලාවේදී 50 වෙනි සංවත්සර උළෙල උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී. මෙම උත්සවය අලලා නිකුත් කරන ලද සමරු කලාපයෙහි රාජ්‍ය නායකයින්ගේ සහ සමුපකාර නායකයින්ගේ සුභ පැතුම් පණිවුඩ ඇතුළත් වු අතර සමිතිය පිළිබඳ තොරතුරු සමග සියලු සාමාජිකයින්ගේ ඡායාරූප ද ඇතුලත් විය.

සමිතියේ ආරම්භක සාමාජිකයෙකු ලෙස ඇතුලත්ව විවිධ තනතුරු දරමින් වර්තමානයෙහි සභාපතිවරයා වශයෙන් කටයුතු කරන කේ. ගිංතොටගේ මහතාට වසර 50ක සාමාජිකත්වය වෙනුවෙන් විශේෂ තිළිණයක් පිරිනමන ලදී. ඒ සමගම ආරම්භක සභාපතිනිය හා සාමාජිකයන් දෙපළකට ද වසර 25 ට වැඩි ස්වෙච්ඡා නිලධාරීවරුන්ට ද වසර තිහකට වැඩි කාර්‍ය මණ්ඩලයේ දෙපලකට ද තිළිණ ප්‍රදානය කරන ලදී. ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් සියලුම සාමාජිකයන්ට විශේෂ තිළිණයක් පිරිනැමීමත් සිදුවිය. මෙම උත්සවය සමනළ ළමා සාමාජයේ නර්තන අංග දෙකකින් වර්ණවත් වු අතර සියලුම සාමාජිකයන් ඊට සහභාගි වූහ.

**ගරු අධ්‍යක්‍ෂ මන්ඩලය - 2019**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | කරුණාදාස ගිංතොටගේ මයා |
| **ගරු උපසභාපති** | : | එම්.ඒ.අනුර ශාන්ත මයා |
| **ගරු භාණ්ඩාගාරික** | : | රිචඩ් කරුණාරත්න මයා |
| **ගරු ලේකම්** | : | සුනිලා ද සිල්වා මිය |
| **ගරු කාරකසභික** | : | ලාල් ගුණසේකර මයා |
| **ගරු කාරකසභික** | : | අරුණ හෙට්ටිආරච්චි මයා |
| **ගරු කාරකසභික** | : | ඩබ්.එම්. අසේල මයා |
| **ගරු කාරකසභික** | : | ඩබ්.එස්. ආරියපාල මයා |
| **ගරු කාරකසභික** | : | ජීවනී කුලතිලක මිය |
| **ගරු කාරකසභික** | : | හර්ෂ සුරංග මයා |
| **ගරු කාරකසභික** | : | චමිත් ජයන්ග මයා |

**සමිතියේ අනු කමිටු**

මුදල් අනු කමිටුව
සුබ සාධක අනුකමිටුව
අධ්‍යාපන අනුකමිටුව
සංවර්ධන අනුකමිටුව
කාන්තා කමිටුව
තරුණ කමිටුව

**බැංකු කාර්‍ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| **කළමනාකාරිණිය** | : | ටී.එස්. ගනේගොඩ මිය |
| **සහය කළමනාකාරිණිය** | : | සුදර්මා පෙරේරා මිය |
| **කළමනාකරණ සහකාර** | : | යමුනා හපුආරච්චි මිය |
| **කළමනාකරණ සහකාර** | : | දමිත් රුක්ෂාන් මයා |
| **කළමනාකරණ සහ්කාර** | : | ඩිල්හාන් කුමාර මයා |
| **කළමනාකරණ සහකාර** | : | කුෂාන් මලින්ද මයා |
| **කළමනාකරණ සහකාර** | : | සනෙලි කියෝෂනි මිය |
| **රියදුරු** | : | සමන් කුමාර මයා |
| **කා.කා.ස.** | : | චන්ද්‍රා නානායක්කාර මිය |
| **ආරක්‍ෂක නිලධාරි** | : | ආර්. පද්මසිරි මයා |
| **ආරක්‍ෂක නිලධාරි** | : | බී.ඒ. ධර්මදාස මයා |

*08 පිටුවට...*

# 50 වෙනි සංවත්සරය අභිමානයෙන් සැමරූ

## නාවල - කොස්වත්ත සණස සමිතිය



ආරාධිත අමුත්තන් සභාවට කැඳවාගෙන යාම



උත්සවයට සහභාගි වූ සණස නායකයින්, මහඇමතිතුමා, කෝට්ටේ නගරාධිපති මදුර විතාන,



ගරු සභාපති කරුණාදාස ගිංතොටගේ මහතාට අඛණ්ඩ 50 වසරක සේවය වෙනුවෙන් ප්‍රදානය කරන ලද තිළිණය හා රන් පවුම ගරු බස්නාහිර පලාත් මහඇමති ඉසුරු දේවප්‍රිය මැතිතුමා අතින්



අවුරුදු 25කට වැඩි ප්‍රධාන නිලතල දැරූ දැනට උපසභාපති ශාන්ත මල්ලවආරච්චි මහතාට තිළිණ ප්‍රධානය ගරු සණස සංවර්ධන බැංකුවේ හිටපු සභාපති කිරිවන්දෙනිය මහතා



අවුරුදු 25 වැඩි දැනට ගරු ලේකම් සුනිලාද සිල්වා මියට තිළිණ ප්‍රධානය ගරු සමුපකාර ප්‍රසාදිනි ඩැනිසන් වීරසූරිය මහතා



භාණ්ඩාගාරික රිචඩ් මහතාට අවුරුදු 25 වැඩි ස්වෙච්ඡා නායකත්වයට සමරු තිළිණ ප්‍රදානය ගරු බස්නාහිර පලාත් මහඇමති ඉසුරු දේවප්‍රිය මහතා අතින්



සභාව අමතන ගරු සණස සංවර්ධන බැංකුවේ හිටපු සභාපති කිරිවන්දෙනිය මැතිතුමා



කළමනාකාරතුමිය ලෙස අවුරුදු 35 ඉක්මවා සේවය කල සෝමා ගනේගොඩ මියට සණස සංවර්ධන සමිතියේ සභාපතිනි සමදුනි කිරිවන්දෙනිය මැතිණිය විසින් තිළිණ ප්‍රදානය



සංවත්සරයට සහභාගි වූ සාමාජිකයින් කොටසක්



සහභාගි වූ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය



අවුරුදු 35 වැඩි සේවාවක් කල නියෝජ්‍ය කළමණාකාරිතුමියට තිළිණ ප්‍රදානය සණස සංවර්ධන සමිතියේ සභාපතිනි සමදුනි කිරිවන්දෙනිය මැතිණිය



ළමා සමාජයේ නර්තන ඉදිරිපත් කරන ලද දරුවන් හා ළමා සමාජයේ නායක ජීවනි මිය ඇතුළු නැටුම් සකස්කල තරුණ කමිටු සාමාජිකයින්



උදාර කලායතනයේ දරුවන්ගේ සංදර්ශනයක්